ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
HRC2406 - මානව සම්පත් කළමනාකරණය සඳහා කුසලතා
අවසාන විභාගය - **2025**
කාලසීමාව - පැය තුනක් **(03)**

244

---

**දිනය: 2025 අගෝස්තු මස 31** **වේලාව: පෙ.ව. 9.30 සිට ප.ව 12.30 දක්වා**

---

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය රචනා ශෛලීය ප්‍රශ්න වලින් සමන්විත වන අතර එයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 100 කි.
- **ප්‍රශ්න හයෙන් ඕනෑම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- සැම ප්‍රශ්නයකටම ලකුණු 20 ක් ඇත.
- **ලබා දී ඇති පිළිතුරු පොතෙහි අදාළ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු විය හැකිය.**

---

**ප්‍රශ්නය 01**

"චිත්තවේගීය බුද්ධිය (Emotional intelligence) යනු, ඔබට ඔබම සහ අනෙකුත් පුද්ගලයින් වඩා හොඳින් තේරුම් ගත හැකි සමාජීය සහ චිත්තවේගීය කුසලතා සමූහයක් තිබීම ලෙස සැලකිය හැකිය." ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද ? සංවිධානයක වැඩ කිරීමේදී චිත්තවේගීය බුද්ධියේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 20 )

**ප්‍රශ්නය 02**

දිනෙන් දින වෙනස් වන නවීන ලෝකය තුළ, ඔබට හිතෙන පරිදි, අනාගතයේ මානව සම්පත් කළමනාකරුවන් සතු විය යුතු මෘදු කුසලතා මොනවාද?" නවීන මෘදු කුසලතා 5ක් උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 20 )

**ප්‍රශ්නය 03**

කාර්ය නීතිමය සදාචාර (Work Ethics) යනු මානව සම්පත් වෘත්තිකයින්ගේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන අතර, සදාචාරමය ප්‍රමිතීන් රැකීම යනු හුදු නෛතික වගකීමක් පමණක් නොව, පුද්ගලයා සහ ආයතනය යන දෙකම සාර්ථක කරවා ගැනීම සඳහා යොදා ගත හැකි උපායමාර්ගික මෙවලමක් (strategic aspect) ලෙසද සලකිය හැක." මෙම අදහසට ඔබ එකඟ වන්නේද ? ඔබ එකඟ වන්නේ නම් හෝ එකඟ නොවන්නේ නම්, ඒ සඳහා උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 20 )

**ප්‍රශ්නය 04**

"කණ්ඩායම් සහයෝගීතාවය අන්තර් පුද්ගල කුසලතාවන්හි ප්‍රධාන අංගයක් වන අතර, කණ්ඩායමක් සමඟ හොඳින් වැඩ කටයුතු කරන පුද්ගලයෙකු වීම මානව සම්පත් වෘත්තිකයන් සඳහා ප්‍රධාන නායකත්ව කුසලතාවයකි." මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය තුලින් උදාහරණ සපයමින් ඉහත ප්‍රකාශය විස්තර කරන්න.

(ලකුණු 20 )

**ප්‍රශ්නය 05**

"ඵලදායී සන්නිවේදනය රැකියා ස්ථානයේ සාර්ථකත්වය සඳහා බලපාන ප්‍රධාන කුසලතාවයකි."

අ) රැකියා ස්ථානයේදී සන්නිවේදන කුසලතාවල ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 08)

ආ) ලිඛිත, වාචික සහ අවාචික සන්නිවේදනය මෙන්ම සවන්දීමේ කුසලතා ද, සංවිධානයක් තුළ ඵලදායී ලෙස භාවිතා කළ හැකි ආකාරය අදාළ උදාහරණ සපයමින් විස්තර කරන්න. (ලකුණු 12)

**ප්‍රශ්නය 06**

මෘදුකාංග සමාගමක ව්‍යාපෘති කළමනාකරුවෙකු වන රවී, එකවර ඉහළ ප්‍රමුඛතා ව්‍යාපෘති කිහිපයක් හසුරුවමින් සිටී. මෑතකදී, ඔහුට අධික ලෙස මානසික පීඩනයකින් , ආතතියට ලක්ව, , නියමිත දින නියමයන් මග හැරී, තෙහෙට්ටුවට පත්ව ඇති බවට සලකුණු පෙන්නුම් කරයි.

මෙම තත්ත්වය මත පදනම්ව,ඔහුට ආතතිය සඵලදායීව කළමනාකරණය කිරීම සඳහා යොදාගතහැකි උපාය මාර්ග සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**(ලකුණු 20*ප්‍රශ්න 05 = මුළු ලකුණු 100)**

**- ප්‍රකාශන හිමිකම් ඇවිරිණි -**